# ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක තොරතුරු ඇතුළත් අන්තර්ජාලීය විෂය පෝටල (Portals) පිළිබඳ ඇගයීමක්

ජේ.එම්.එස්. දිලිනිකා*

**සංක්ෂේපය**

වර්තමාන සමාජය තුළ තොරතුරු සඳහා හිමිව ඇත්තේ සුවිශේෂී වූ ස්ථානයකි. කුමන ආකාරයේ තොරතුරක් සඳහා වුවද එම තොරතුරු වෙනුවෙන් සුවිශේෂී වූ ග්‍රාහක පිරිසක් වර්තමාන තොරතුරු සමාජය තුළ ගොඩනැගී ඇත. ප්‍රවර්තන ගෝලීය සංකල්පය තුළ අන්තර්ජාලය මගින් නිර්මාණය කර ඇති නූතන තොරතුරු මූලාශ්‍රයන් තුළින් මෙම තොරතුරු වලට ප්‍රවේශ වීම වඩාත් පහසු කර ඇත.

මෙහිදී අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක වූ තොරතුරු එක්රැස් කර ඇති අන්තර්ජාල මූලාශ්‍රයන් පිළිබඳවය. පුරාවිද්‍යාව විෂය මගින් ආවරණය වන්නේ ප්‍රාථමික මානව ක්‍රියාකාරකම්, සිද්ධීන් හා එම උරුම සංරක්ෂණය ආදිය ය. ඒ අනුව මෙම විෂය වර්තමානයේ විවිධ විෂයන් හා ඒකාබද්ධව ගෝලීය පරිසරය තුළ නව තාක්ෂණය හා බද්ධ වී ඇත. ඒ අනුව ප්‍රවර්තන නූතන තොරතුරු මූලාශ්‍ර ඔස්සේ පුරාවිද්‍යාත්මක තොරතුරු ලොව සිටින ඕනෑම පුද්ගලයෙකුට, ඕනෑම අවස්ථාවක, ඕනෑම ස්ථානයක සිට ලබාගැනීමේ හැකියාව මෙම අන්තර්ජාල තොරතුරු මූලාශ්‍ර මගින් ලබාදී ඇත.

**හැඳින්වීම**

තොරතුරු මූලාශ්‍රයක් යනු තොරතුරු එක්රැස් කර ඇති ස්ථානයකි. එමගින් එක් ස්ථානයක සිට අදාළ සියලුම තොරතුරු කරා ප්‍රවේශ වීමේ හැකියාව ලබා දී ඇත. සාධිකාරී වූ විධිමත් තොරතුරු මූලාශ්‍රයක් භාවිත කිරීම තුළින්, විවිධ වූ සාවද්‍ය පුරුක් ( Fake Links) ඔස්සේ ගොස් සාධිකාරී නොවන තොරතුරු ලබාගැනීමේ සම්භාවිතාව අවම කරන අතර වඩාත් සාධිකාරී වූ තොරතුරු පර්යේෂකයා වෙත ළඟා කර දේ. පුරාවිද්‍යාව විෂය ක්ෂේත්‍රය පිළිබඳව විමසා බලන කල්හි මෙම පුරාවිද්‍යාත්මක තොරතුරු අන්තර්ගත කර ඇති විවිධ සාධිකාරී වූ අන්තර්ජාලීය තොරතුරු මූලාශ්‍ර වේ.

- විෂය බිහිදොර (Portals)
- විෂය දොරටු (Subject Gateways)
- වෙබ් අඩවි (Websites)

ආදිය නූතන අන්තර්ජාල මූලාශ්‍ර අතර ප්‍රධාන වේ.

* *තාවකාලික කථිකාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය,* shalanijayamanne@gmail.com

## පුරාවිද්‍යාත්මක අන්තර්ජාල තොරතුරු මූලාශ්‍ර ( Archaeological Information Sources)

### 1. පුරාවිද්‍යාව හා සම්බන්ධ විෂය පෝටල **( Arachaeological portals)**

විෂය පෝටලයක් යනු යම් විෂයකට අදාළ සියලු තොරතුරු එකට එක් කර ඇති එක් මධ්‍යගත ස්ථානයකි.

“A Central place for making all types of Information accessible to an audience of varifying range.”

මේ අනුව, ශ්‍රී ලංකාව තුළ පුරාවිද්‍යාව සම්බන්ධව නිර්මාණය කර ඇති මෙම විෂය පෝටලයන් තුළින් පුරාවිද්‍යාව විෂය සම්බන්ධ සියලුම තොරතුරු අන්තර්ජාලයේ එක් ස්ථානයක් තුළින් ලබාගත හැකි වේ. පුරාවිද්‍යාව හා සම්බන්ධව විශේෂිත තොරතුරු ඇතුළත් කර ඇති මෙවන් පෝටලයන්, තුළ වෙබ් පිටුවකට වඩා සුවිශේෂී වූ භාවයක් දක්නට ඇත. එයට හේතුව වන්නේ, අදාළ විෂයට සම්බන්ධ තොරතුරු විවිධ පරාසයන් ඔස්සේ ඒකාබද්ධ කර තිබීමයි.

ශ්‍රී ලංකාවේ මෙවන් විෂය පෝටලයන්ට නිදසුන් පහත පරිදි දැක්විය හැකිය.

- **ශ්‍රී ලංකා සංස්කෘතික තොරතුරු පෝටලය** (Sri Lanka Cultural Portal)




මූලාශ්‍රය:http://www.culture.lk/web/

මෙය තුළ පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකමකින් යුක්ත වූ තොරතුරු එක්රැස් කර භාෂා තුනක් යටතේ එනම්, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පාඨකයා වෙත ලබා දේ. මෙහි වැදගත්කම වන්නේ අන්තර්ජාලයේ තැනින් තැන විසිරී තිබෙන, වෙබ් අඩවි කිහිපයක් ගවේෂණය කර සොයාගත යුතු තොරතුරු එක් වෙබ් පිටුවක් තුළ සම්බන්ධ කර තිබීමයි. එමගින් , බොහෝ දෙනාගේ ඇස නොගැටුණු , අතහැරුණු තොරතුරු සමුදායක් කරා ප්‍රවේශ වීමට හැකියාව ලබා දේ.

මෙම පෝටලයෙහි සංස්කෘතික අමාත්‍යාංශය මගින් තෝරාගත් සාධිකාරී වූ වෙබ් අඩවි විස්සක තොරතුරු එකිනෙකට සම්බන්ධ කර ඇත. එමගින් අදාළ තොරතුරු වල සාධිකාරීබව තහවුරු වේ. මෙම මූලාශ්‍රය තුළ පහත ප්‍රවර්ග යටතේ තොරතුරු දක්වා ඇත.

**1. ඉතිහාසය (මානව ජනාවාස ඇතිවීම, ජනයා, රාජධානි)**

මෙයට අදාළ තොරතුරු ලබාගෙන ඇත්තේ Archaeology view හා Heritage Sri Lanka යන වෙබ් අඩවි වල තොරතුරු ඒකරාශී කර ගනිමිනි. ඒ තුළ ආරාම, ඉතිහාසය, ජන වාර්ගික කණ්ඩායම්, ඉපැරණි වාරි මාර්ග පද්ධති ආදිය පිළිබඳ වූ තොරතුරු මෙන්ම, කාලීන වටිනාකමකින් යුක්ත පුරාවිද්‍යාත්මක තොරතුරු හා ප්‍රවෘත්ති ආදිය පිළිබඳ වේ. මෙහි Archaeology view යන වෙබ් පිටුවෙන් ගත් තොරතුරු පුරාවිද්‍යාව හා ඉතිහාසය පිළිබඳ ගවේෂණ කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද ඒවා වේ.

**2. ස්ථාන (ඓතිහාසික ආගමික වශයෙන් වැදගත් ස්ථාන)**

මෙයට අයත් වන්නේ දළදා මාළිගාව පිළිබඳ වෙබ් අඩවිය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය, ගාලු උරුමය පදනමේ නිල වෙබ් අඩවිය, ඩෙල්ෆ්ට් දූපත පිළිබද ඓතිහාසික තොරතුරු, ශ්‍රී ලංකීය උරුමය, සංචාරක අත්දැකීම් පිළිබද විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් රචිත ලිපි ,මීගමුව හා ඒ අවට ඓතිහාසික ආගමික පසුබිම පිළිබද තොරතුරු ආදිය පිළිබද තොරතුරු ය.

විශේෂත්වය වන්නේ මෙම තොතරතුරු එකතුව සතුව ඡායාරූප හා වීඩියෝ ද අන්තර්ගත වීමයි. ඒ තුළ තොරතුරු සොයන්නෙකුට තමන් සොයන තොරතුරු පිළිබද පෘථුල අවබෝධයක් ලබාගත හැකිය.

**3. දෘශ්‍ය කලාව (මූර්ති, ගෘහ නිර්මාණ, චිත්‍ර හා අත්කම්)**

මෙයට පාරම්පරික දැනුම පිළිබද වූ වෙබ් අඩවියක තොරතුරු එක්කර ඇත. එය තුළ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන ලිපි, වෙහෙර විහාර ඇතිකිරීමේදී යොදාගත් මෙවලම්, පංච මහා විහාර, බුදු පිළිම, රාජකීය ජල උද්‍යාන ආදී පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන තොරතුරු එක්රැස් කර ඇත.

**4. නාට්‍ය කලාව (නාට්‍ය, චිත්‍රපට, ගීත, නෘත්‍ය හා සංගීතය)**

ශාන්තිකර්ම, සාම්ප්‍රදායික රූකඩ හා රූකඩ කලා කෞතුකාගාරය, ටවර් හෝල් රඟහල පදනමේ වෙබ් අඩවිය ආදියෙහි තොරතුරු මෙයට එක්කරගෙන ඇත. එම සියලුම තොරතුරු එකට එක්කර එකම මූලාශ්‍රයක් තුළ ගොනුකර ඇත.

**5. භාෂාව හා සාහිත්‍යය**

පන්සිය පනස් ජාතකය, යන්ත්‍ර මන්ත්‍ර හා හෙළ වෙදකම පිළිබද පුරාණ පොතපතෙහි සදහන් තොරතුරු, හෙළ පිරුළු ( ශ්‍රව්‍ය - දෘශ්‍ය), ශ්‍රී ලංකාවේ සිංහල පදිංචිකරුවන් හා රාවණ රජු

පිළිබඳ ජනශ්‍රැතියේ ඇති මතවාද හා අදාළ තොරතුරු ආදිය මෙහි විවිධ මාධ්‍ය ඔස්සේ දක්වා ඇත.

**6. ඓතිහාසික ක්‍රීඩා හා තරඟ**

හෙළ ජන ගී, හෙළ වෙදකම ආදී විවිධ දේශීය උරුමය රැගත් තොරතුරු එකතුවක් මෙහි වේ.

**7. ජීවන රටාව (සිරිත් විරිත්, පුද පූජා ආදිය)**

සාම්ප්‍රදායික අංගම්පොර ක්‍රීඩාව ආදී විවිධ තොරතුරු මෙම එකතුවෙහි වේ.

**8. රාජ්‍ය ආයතන (දෙපාර්තමේන්තු, ආයතන)**

මෙයට පහත ආයතන හා දෙපාර්තමේන්තු ඒකාබද්ධ කර ඇත.

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය
- මධ්‍යම සංස්කෘතික අරමුදල
- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය
- ශ්‍රී ලංකාවේ ඌව පළාතේ සංචාරක ව්‍යාපාරය
- දකුණු සංචාරක කාර්යාංශය

මෙම තොරතුරු පෝටලයට පහත රටවල සංස්කෘතික වෙබ් අඩවියන් ද සබඳතාවය දක්වා ඇත.

- සාර්ක් සංස්කෘතික ද්වාරය
- ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල පෝටලය
- තුර්කි සංස්කෘතික ද්වාරය
- ශ්‍රී ලංකා රජයේ නිල සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
- තායිවාන සංස්කෘතික ද්වාරය
- ලැරිසා සංස්කෘතික ද්වාරය
- ශ්‍රී ලංකා රජයේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- සී සිස් - ටාටු සංස්කෘතික ද්වාරය
- රුසියානු සංස්කෘතික ද්වාරය

මේ අනුව පුරාවිද්‍යාව විෂය යටතේ එන විවිධ ආකාරයේ ක්ෂේත්‍ර පිළිබඳ වෙබ් අඩවිවල අඩංගු තොරතුරු එකම ස්ථානයකින් ලබාගත හැකි පරිදි මෙම ශ්‍රී ලංකා සංස්කෘතික තොරතුරු පෝටලය නිර්මාණය කර ඇත. එක් ප්‍රවේශයක් ලබා දී ඇත.

- **Heritage Sri Lanka Portal – ( http://www.srilanka.travel/heritage-sri-lanka)**

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය මගින් පවත්වාගෙන යන මෙම විෂය පෝටලය ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හා පුරාවිද්‍යාත්මක ස්ථාන හා සම්බන්ධව තොරතුරු ලබාගැනීම සඳහා නිර්මාණය කර ඇත. මෙය තුළ ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමය පිළිබඳ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තොරතුරු දක්වා ඇත.

ඒ අතර, ශ්‍රී ලංකාවට සංචාරය සඳහා පැමිණීමට හේතූන් දක්වා ඇති අතර ඒ යටතේ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හා එහි වටිනාකම පිළිබඳව කරුණු දක්වා ඇත. එහිදී, සීගිරිය, අනුරාධපුර, පොළොන්නරුව හා යාපහුව වැනි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථානයන් පිළිබදව මෙහි තොරතුරු එක්රැස් කර ඇත. එහිදී, එම ස්ථානයන් පිළිබඳ තොරතුරු මෙන්ම , සංචාරක වැඩසටහන්, අන්තර්ජාල විමසීම් ආදී සංචාරකයෙකුට ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකම හඳුන්වාදීමේ සිට ලංකාවට සංචාරයට පැමිණීම හා ඉන් පසු සිදුවන වැඩසටහන් ආදිය පිළිබදව සියලු තොරතුරු එක් ස්ථානයක ගොනුකර ඇත. ඒ අනුව, වෙබ් අඩවි කිහිපයක් ගවේෂණය කර සොයාගත යුතු තොරතුරු එකම වෙබ් පිටුවක ඒකීය ක්‍රමයක් යටතේ මෙම “විෂය පෝටල ”සංකල්පය යටතේ ගොනුකර ඇත.


- **SAARC Cultural Portal – (http://www.saarcculture.org/portal/countries/)**

මෙහි දක්වා ඇත්තේ සාර්ක් කලාපයේ රටවල් සියල්ලේම පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික තොරතුරුය. සාර්ක් කලාපයට අයත් වන රටක් ලෙස, මෙහි ශ්‍රී ලංකාව පිළිබදව ද තොරතුරු වේ. එහි තොරතුරු එක්රැස් කර ඇත්තේ Cultural Identities, Cultural festivals and events, Traditions and Rituals , Language, Heritage Sites, Archaeology, Sculpture and Decorative art, Handicrafts, Costumes ආදී ප්‍රවර්ග යටතේ ය.

එයට අමතරව මෙම පෝටලය තුළ සම්පත් එකතුවක් ද වේ. එහි, ශ්‍රී ලංකාව පිළිබඳ ලියැවී ඇති පුරාවිද්‍යාත්මක කෘති පිළිබඳ තොරතුරු වේ.

උදා:

මූලාශ්‍රය:**www.saarcculture.org**




Sigiriya-Kassapa's Homage To Beauty

Author Name : Siri Gunasinghe

Country : Sri Lanka

Publisher : Vijitha Yapa Publications Sri Lanka

Publised Year : 2008

Publication Format : Book

මේ අනුව, මෙම විෂය පෝටලය තුළ විවිධ ස්වරූපයන්ගෙන් යුත් තොරතුරු එකතුවක් ඇති බව හඳුනාගත හැකිය. එක් විෂයනට අදාළ සියලුම තොරතුරු මෙලෙස එක් මූලාශ්‍රයක් තුළ සංවිධානගත වී තිබීම මත පුරාවිද්‍යාවට අදාළ තොරතුරු සොයන්නෙකුට හට වඩාත් කාර්යක්ෂමව අදාළ තොරතුරු කරා ප්‍රවේශ විය හැකිය.

- **ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල පෝටලය - (www.gov.lk)**

මෙය තුළ ශ්‍රී ලංකාව සම්බන්ධ සියලුම තොරතුරු ඇතුළත් වේ. පුරවැසියෙකුට මෙන්ම ලංකාවේ රාජ්‍ය තොරතුරු විමසීමට අවශ්‍ය ඕනෑම පුද්ගලයෙකුට මෙම බිහිදොර ප්‍රයෝජනවත් වේ. මෙය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන්නේ, මෙය තුළ ඇති වෙබ් අඩවි නාමාවලිය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය සම්බන්ධ කර පුරාවිද්‍යාත්මක තොරතුරු සමුදායකට ප්‍රවේශය සලසා දී ඇති නිසාය. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම මෙය තුළ තොරතුරු ගවේෂණය කළ හැකිය.

මෙය තුළ කොටස් 12 ක් යටතේ තොරතුරු පෙළ ගස්වා ඇත.

**1. පුරාවිද්‍යාත්මක සේවා**

මෙය යටතේ මහජනයා දැනුවත් කිරීම, වීඩියෝ/ කැමරා බලපත්‍ර, පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණ, පුරාවිද්‍යා සංරක්ෂණ සඳහා ඉල්ලීම් ආදිය පිළිබඳ ගවේෂණ පුරුක් සපයා ඇත.

**2. ගවේෂණ**

ගවේෂණ අංශයේ අරමුණු කාර්යයන් මෙන්ම පුරාවිද්‍යාත්මක ආරක්ෂිත ස්ථාන පිළිබඳව මෙහි තොරතුරු වේ. ඒ යටත් පෞරාණික වාරිමාර්ග ක්‍රම, සමුද්‍රිය පුරාවිද්‍යාත්මක ගවේෂණ, පුරාවිද්‍යා රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම ආදි දේ පිළිබඳ තොරතුරු දක්වා ඇත.

**3. කැණීම්**

ශ්‍රී ලංකාවේ කැණීම් ඉතිහාසය, පර්යේෂණ කැණීම්, පශ්චාත් කැණීම් විශ්ලේෂණ ආදිය පිළිබඳ තොරතුරු මෙහි වේ.

**4. වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ**

සංරක්ෂණ ව්‍යාපෘති පිළිබඳ හා ඉදිරියේදී කිරීමට බලාපොරොත්තුවන වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ කාර්යයන් පිළිබද තොරතුරු මෙහි වේ.

**5. අභිලේඛන හා නාණක විද්‍යා**

අභිලේඛන සොයාගැනීම් හා පර්යේෂණ පිළිබද පුරාවිද්‍යාත්මක වූ තොරතුරු මෙහි වේ.

**6. කෞතුකාගාර**

මෙහි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු කෞතුකාගාර ලැයිස්තුවක් දක්වා ඇත. ශ්‍රී ලංකාවේ නොයෙක් පළාත් වල පිහිටුවා ඇති කෞතුකාගාරයන්හි තොරතුරු මෙම බිහිදොර තුළ

අන්තර්ගත කර ඇත. එයට අමතරව පුරාවිද්‍යා කෞතුකාගාර ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු අන්තර්ගත කර ඇත.

**7. ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයුම්**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් දියත් කරනු ලබන ව්‍යාපෘති පිළිබඳව හා ඒවා අධීක්ෂණය පිළිබඳ තොරතුරු අන්තර්ගත කර ඇත.

**8. පොදු සේවා**


ප්‍රකාශන එළිදැක්වීම, පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන ආදිය පිළිබඳ වන පොදු තොරතුරු රැසක් මෙම කොටස තුළ වේ.

**9. නඩත්තු** (පුරාවිද්‍යාත්මක ස්ථාන නඩත්තුව පිළිබද තොරතුරු වේ.)

**10.නීති** - පුරාවස්තු ආරක්ෂා කරගැනීමේ අණ පනත් පිළිබඳව තොරතුරු මෙහි වේ.

**11. පුරාවිද්‍යාත්මක ස්ථාන**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන ස්ථාන පිළිබඳව විස්තර හා ඡායාරූප එකතුවක් මෙහි වේ. ඒ අනුව පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන ස්ථාන 21 ක පමණ තොරතුරු මෙහි දක්වා ඇත. විශේෂත්වය වන්නේ මූලපද (Keywords) මගින් , මෙන්ම සිතියම්ද භාවිත කර තොරතුරු සෙවිය හැකි වීමයි.




**12. රසායන සංරක්ෂණ**

රසායන සංරක්ෂණ පර්යේෂණ හා එම අංශයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව තොරතුරු ඡායාරූප සහිතව මෙම මෙනුව තුළ දක්වා ඇත.

මෙම තොරතුරු පෝටලය තුළින් පුරාවිද්‍යාවට අදාළ තොරතුරු අන්තර්ජාලයේ එකම ස්ථානයකින් ලබාගත හැකිය. ඒ අනුව, පුරාවිද්‍යාවට අදාළ තොරතුරු සොයන්නෙකු හට වඩාත් කාර්යක්ෂමව හා සාධිකාරිව ශ්‍රව්‍ය දෘශ්‍ය ආදී විවිධ මාධ්‍යයන්ගෙන් යුක්තව තොරතුරු ලබාගැනීමට මෙම මූලාශ්‍ර මහත් පිටුවහලක් වේ.

**සමාලෝචනය**

වර්තමාන සමාජයේ මූලික පදනම වී ඇත්තේ තොරතුරු ය. මානවයාගේ ඓතිහාසික සිදුවීම් හා බැඳි පුරාවිද්‍යාව වැනි විෂයක් සඳහා මෙම තොරතුරු සමාජය තුළ ඉතා ඉහළ අවධානයක් යොමුව ඇත. එම තොරතුරු අවශ්‍යතා අනුව අවශ්‍ය පුද්ගලයාට, අවශ්‍ය තොරතුර, අවැසි වේලාවට ලබා දීමට නම් ඒ සඳහා විධිමත් තොරතුරු සංවිධානයක් අවශ්‍ය ය. එහිදී, කිසියම් විෂයකට අදාළ සියලුම තොරතුරු එකම ස්ථානයකදී ලබාගැනීමට හැකිවීම වඩාත් කාර්යක්ෂම ය. මේ අනුව පුරාවිද්‍යාව පිළිබඳ තොරතුරු සොයන්නෙක් හට ඉහත විෂය පෝටලයන්ගෙන් සැලසෙන සේවය අති මහත්ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

http://www.culture.lk/web/, Accessed on September 02, 2014

http://www.srilanka.travel/heritage-sri-lanka, Accessed on September 02, 2014

http://www.saarcculture.org/portal/countries/, Accessed on September 10, 2014

http://www.gov.lk, Accessed on September 02, 2014

http://en.wikipedia.org/wiki/Portal:Archaeology, Accessed on September 10, 2014

http://en.wikipedia.org/wiki/Web_portal. Accessed on September 10, 2014